ලංකාව දැනුම් කේන්ද්‍රයක් බවට පත්කිරීම

අද ඇතැම් උගත්තු ලංකාව ආසියාවේ දැනුම් කේන්ද්‍රය බවට පත්කිරීම ගැන කතාකරති. එහෙත් ඒ කිසිවෙක් අප ආසියාවේ දැනුම් කේන්ද්‍රය බවට පත්වන්නේ කෙසේ දැයි නො කියති. අද කුඩා දරුවකුට පවා අන්තර් ජාලයෙන් විවිධ දැනුම් ලබාගත ගත හැකි ය. එහෙත් ඒ දැනුම් එසේ ලබාගෙන අන් අයට ද ලබාගත හැකිවන පරිදි එක තැනක තැබීමෙන් හා විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන ඔස්සේ ඒ දැනුම බෙදාදීමෙන් අපට ආසියාවේ දැනුම් කේන්ද්‍රයක් බවට පත්විය නො හැකි ය. අපට පිටින් ලබාගත හැකි දැනුමක් වේ නම් අනෙක් සෙසු ලෝකයාට ද ඒ දැනුම ලබාගත හැකි බව අමතක නොකළ යුතු ය. අපට සමහර විට එසේ ලබාගන්නා දැනුම ලෝකයට අඩු මුදලකට විකිණීමට හැකිවනු ඇත. අද මෙරට ඇතැම් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බටහිර වෛද්‍ය විද්‍යාව ඉගෙනීමට නේපාලයට යන්නාක් මෙන් ඇතැම් විට එවිට ජපානය හා තවත් එවැනි රටවල් කිහිපයක් හැරුණු කොට ආසියාවේ අනෙක් රටවලින් බටහිර දැනුම සොයා ශිෂ්‍ය ශිෂ්‍යාවන් අප රටට පැමිණෙනු ඇත. එහෙත් එපමණකින් මෙරට ආසියාවේ දැනුම් කේන්ද්‍රය බවට පත් නො වේ. වෙනත් රටවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් එවිට අප රටට පැමිණෙනු ඇත්තේ අපෙන් අඩු මුදලට දැනුම ලබාගැනීමට හැකි නිසා මිස ඒ දැනුම වෙනත් රටක නැති නිසා නො වේ. අපේ සිසුන් නේපාලයට ගිය පමණින් නේපාලය බටහිර වෛද්‍ය විද්‍යාවේ දැනුම් කේන්ද්‍රය ලෙස සලකන්නකු නැත.

අපට ආසියාවේ නොව ලෝකයේ ම දැනුම් මධ්‍යස්ථානයක් බවට පත්විය හැකි ය. එහෙත් ඒ වෙනත් අයගේ දැනුම රැස්කර ලෝකයට ඒ බෙදාදීමෙන් නො වේ. අප ලෝකයේ වෙනත් රටක නොමැති දැනුම් අප රටෙහි නිර්මාණය කළ යුතු ය. එවිට ඒ දැනුම සම්බන්ධයෙන් ලෝකයේ ම දැනුම් කේන්ද්‍රය බවට අපට පත්විය හැකි ය. අතීතයෙහි අප රට දැනුම් කේන්ද්‍රයක් වී නම් එයට හේතුව වෙනත් රටක ලබාගත නොහැකි දැනුමක් මෙහි තිබීම ය. මෑත කාලයෙහි පවා දැනුම් නිර්මාණයක් නො කෙරුණ ද ගිහි පැවිදි සිසුහු පිටරටින් ථෙරවාද බුද්ධහම ඉගෙනීමට විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන්වලට පැමිණිය හ. අද ද ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයට බංගලාදේශය කොරියාව වැනි රටවලින් පැමිණෙන්නෝ වෙති.

ලෝකයට දැනුම් කේන්ද්‍ර එකක් නොව බොහෝ සංඛ්‍යාවක් තිබිය හැකි ය. එයට හේතුව විවිධ දැනුම් ලෝකයේ තිබීම ය. මුළු ලෝකයට ම ඇත්තේ එකම දැනුම් කේන්ද්‍රයක් නම් එයින් කියැවෙන්නේ ලෝකයට ම එක් අධිපතිවාදී දැනුම් පද්ධතියක් ඇති බව ය. අද සිදුවන්නේ බටහිර රටවල් ලෝකයේ එකම දැනුම් කේන්ද්‍රය බවට පත් වී අනෙක් රටවලින් බටහිර රටවලට සිසුන් ආකර්ෂණය කිරීම ය. බටහිරයන් තම දේශපාලන ආධිපත්‍යය යොදාගනිමින් තම දැනුම් පද්ධතිය ලෝකයේ එකම දැනුම් පද්ධතිය බවට පත්කරගෙන ඇත. බටහිර රටවල් කේන්ද්‍රය වූ දැනුම් පද්ධතියෙහි පරිධියෙහි අප වැනි රටවල් ඇත. බටහිර රටවල නිර්මාණය කෙරෙන දැනුම අන්තර්ජාලයෙන් හෝ වෙනත් අයුරකින් හෝ ලබාගෙන ආසියාවේ රටවලට බෙදා දුන්න ද එවිට ද අප ඇත්තේ දැනුම් පද්ධතියෙහි පරිධියෙහි මිස කේන්ද්‍රයෙහි නො වේ. දැනුම් පද්ධතියෙහි කේන්ද්‍රයට අප යෑමට නම් අප සංකල්ප, ප්‍රවාද, ප්‍රමේය ආදී කේන්ද්‍රයෙහි ඇති දැනුම් නිර්මාණය කළ යුතු ය. එහෙත් අපට බටහිර දැනුම් පද්ධතියෙහි එසේ කළ හැකි ද?

අප මේ ප්‍රශ්නය ගැන සිත යොමුකරන්නට වී දැනට අවුරුදු විසිපහකට වැඩි ය. බටහිර විද්‍යාව යනු එකම විද්‍යාව නොවන බවත් වෙනත් විද්‍යා මෙන් ම වෙනත් දැනුම් ද ඇති බවත් එහෙත් ඒ අනෙක් විද්‍යාවන්ට හා දැනුම් පද්ධතීන්ට සමාජයේ තැනක් නැති බවත් ඒ බටහිර දැනුම එකම සත්‍යය වීම නිසා නොව එයට ඇති ආධිපත්‍යය නිසා සිදුවන්නක් බවත් පොත පත කියවීමෙන් මෙන් ම අත්දැකීමෙන් ද අපට අවබෝධ විය. එකල ඇතැම් බටහිර සමාජ විද්‍යාඥයන් හා දාර්ශනිකයන් දැනුම යනු සාපේක්ෂ වූවක් බවත් ඒ සොයාගන්නා ඊනියා සත්‍යයක් නොව සමාජීය නිර්මාණයක් බවත් කියා තිබිණි.

මේ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ක්වොන්ටම් භෞතිකය ඉගැන්වීම මට පවරා තිබිණි. ක්වොන්ටම් භෞතිකය කිසිවකුට නොතේරෙණ දෙයක් යැයි බටහිර භෞතික විද්‍යාව සම්බන්ධයෙන් නොබෙල් ත්‍යාගය දිනාගත් රිචඩ් ෆයින්මාන් මහතා පවසා තිබිණි. යමක් නොතේරෙන්නේ යැයි අප කියන්නේ අපට ජීර්ණ වී ඇති දැනුම් පද්ධතියකින් ඒ දෙය පැහැදිලි කරගැනීමට නොහැකි වූ විට ය. බටහිරයන්ට ජීර්ණ වී ඇති දැනුම කුමක් ද? ඔවුන් සිතන්නේ කෙසේ ද? මේ ආදී ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා චින්තනය යන සංකල්පය අප අතින් නිර්මාණය විය. (මෙරට ජාතික චින්තනය යනු සිංහල චින්තනය ය. එහෙත් ගුණදාස අමරසේකර මහතා ජාතික චින්තනය යනුවෙන් අදහස් කරන්නේ එය නො වේ. 1986 අග රත්නපුර පැවති සම්මන්ත්‍රණයකින් පසුව ජනතාව ඉදිරියේ

© Prof. Nalin De Silva

මේ ධාරා දෙක එකක් බවට පත්විය. ඒ ධාරා දෙකෙහි ඇති වෙනස පසුව පැහැදිලි කරමු.) බටහිරයන්ගේ චින්තනයෙහි න්‍යාය (ලොජික්) ඔස්සේ ක්වොන්ටම් භෞතිකය තේරුම් ගැනීමට නොහැකි බව අපට පැහැදිලි විය. ඔවුන්ගේ න්‍යාය ඇරිස්ටෝටලීය න්‍යාය විය. ඒ න්‍යාය යොදාගන්නා තෙක් බටහිරයන්ට කිසි දිනෙක ක්වොන්ටම් භෞතිකය නො තේරෙනු ඇත.

ඒ අතර ක්වොන්ටම් භෞතිකයට පැවැත්ම හෙවත් සත්බව පිළිබඳ තවත් ප්‍රශ්න විය. ඒ හයිසන්බර්ග් නම් තවත් ශ්‍රේෂ්ඨ (එක් භික්ෂුන් වහන්සේ නමක් මෑතක දී ඇසූ ආකාරයට අප රටේ විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨයන් මිස ශ්‍රේෂ්ඨයන් නැත්තේ ඇයි ද යන්න ද ගවේෂණය කළ යුත්තකි) බටහිර භෞතික විද්‍යාඥයකු සූත්‍රගත කළ අනිශ්චයතා මූල ධර්මය වටා විය. බෝර් හා අයින්ස්ටයින් යන විද්‍යාඥයෝ පිළිවෙළින් ඉන්ද්‍රියානුභූතවාදී හා යථාර්ථවාදී බටහිර දාර්ශනික ගුරුකුල මත පදනම් වී ඊනියා යථාර්ථය හා සත්බව පිළිබඳ වාද කළහ. මේ ප්‍රශ්න ගැන ද කොළඹ විශ්වවිද්‍යාලයේ ගවේෂකයෝ සංවිධානයෙහි සාකච්ඡා පැවැත්විණි. අපට පෙනී ගියේ ක්වොන්ටම් භෞතිකය සිංහල බෞද්ධ චින්තනය මත පදනම් ව තේරුම් ගත හැකි බව ය. පසුගිය දා ඒ ආශ්‍රයෙන් ඉදිරිපත් කරන ලද නිබන්ධනයකට කැලණිය විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යා විෂයයෙන් දර්ශනපති උපාධියක් පිරිනැමිණි. එහි සිංහල බෞද්ධ චින්තනය මත පදනම් ව ක්වොන්ටම් භෞතිකයට නව අර්ථවිවරණයක් සැපයෙන අතර නව කේන්ද්‍රීය පරීක්ෂණ කිහිපයක් වාර්තා වෙයි. ඒ ගැන කැලණිය විශ්වවිද්‍යාලයෙහි පවා දැන් කිසිම උනන්දුවක් නැත. කැලණිය විශ්වවිද්‍යාලයට වසර පනහක් පිරීම නිමිත්තෙන් පළකරන ලද ශාස්ත්‍රීය සඟරාවට සිංහල බෞද්ධ සංස්කෘතියක ක්වොන්ටම් භෞතිකය යන මැයෙන් (ඉංගිරිසියෙන්) ලිපියක් ලියූ මුත් ඒ කියවන ලද්දේ මා සහ ලිපිය සුදුසු දැයි තීරණය කිරීම සඳහා ඒ යවනු ලැබූ ශාස්ත්‍රඥයා පමණක් විය යුතු ය. දැනට අවුරුදු අටක් පමණ තිස්සේ විදුසර පුවත්පතට අපේ ප්‍රවාද යනුවෙන් ලිපි පෙළක් (දැනට ලිපි හාරසියයක් පමණ පළ වී ඇත) ලියන නමුත් කිසිදු උගතකුගේ අවධානයට ඒ යොමු වී නැත. අප විසින් පළකර ඇති දැනුමෙහි අඩුපාඩුකම් තිබිය හැකි ය. ඒ විවේචනය කරනු තබා අඩු තරමින් ඒ පිළිබඳ සැලකිල්ලක් නොදක්වා අප ආසියාවේ දැනුම් කේන්ද්‍රයක් බවට පත්වන්නේ කෙසේ දැයි මට නො තේරෙයි.

එයින් මා කීමට බලාපොරොත්තුවන්නේ මා පළකර ඇති ලිපි නොකියවා මෙරට ආසියාවේ දැනුම් කේන්ද්‍රයක් බවට පත්කර ගැනීමට නොහැකි බව නො වේ. අඩුම තරමින් දැනුම් කේන්ද්‍රයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යන්න පිළිබඳව වත් සාකච්ඡාවක් පසුගිය මාස කිහිපයෙහි වුව ද ඇති වී නැත. දේශපාලනඥයන් දැනුම් කේන්ද්‍රය යන්නෙන් කුමක් අදහස් කරන්නේ දැයි මම නො දනිමි. එහෙත් අවුරුදු විසිපහක් අප කතාකළ ප්‍රශ්නයක යම් සේයාවක් එහි ඇත්නම් ඒ පිළිබඳ සතුටු වෙමි. මෙරට ප්‍රශ්නය වී ඇත්තේ දේශපාලනඥයන්ට වඩා බටහිර ගැති උගතුන් ය. මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු දේශපාලනඥයන් කිහිප දෙනකුට බටහිර දේශපාලන ආධිපත්‍යයට අභියෝගකළ හැකි වුවත් බටහිර දැනුම් ආධිපත්‍යයට අභියෝග කළ හැකි උගත්තු වෙත් ද? බොහෝ දෙනා එවැනි දැනුම් ආධිපත්‍යයක් තිබෙන බවවත් නො දනිති. එහෙත් ඔවුහු නොදැන වුවත් ඒ ආධිපත්‍යය ඉදිරියේ වැඳ වැටෙති. විසිඑක්වැනි සියවස සඳහා උසස් අධ්‍යාපනය යන තේමාව යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට මෙරට උසස් අධ්‍යාපන ආයතනවලට ලෝක බැංකුවෙන් විශාල ණයක් ලැබෙයි. ඒ සඳහා මේ දිනවල ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කෙරෙයි. ථෙරවාද බුදුදහම මත පදනම් ව ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත්කිරීමට මා කිහිප දෙනකු සමග සාකච්ඡා කළත් ලැබුණු ධනාත්මක ප්‍රතිචාරයක් නැත. ජෙනිංග්ස්ගේ විශ්වවිද්‍යාලවලින් මෙරටට වගතුවක් නොවන බව මම දනිමි. (මෙය විශ්වවිද්‍යාල පිළිබඳ අමරසේකර මහතාගේ විවේචනයට වෙනස් වූ කරුණු මත පදනම් වෙයි.) තව මාස පහකින් විශ්‍රාම ගැනීමට සිටින මට සමස්තයක් ලෙස ගත්කල උගතුන් ගැන ඇත්තේ කළකිරීමකි. ව්‍යවහාරික ගණිතය උගන්වන විශ්වවිද්‍යාල කථිකාචාර්යවරයකු ලෙස මගේ වැඩිහිටි ජීවිතය ගෙවිය යුතු යැයි මා තීරණය කෙළේ අවුරුදු පහළොවක කොලු ගැටයකුව සිටි අවධියෙහි ය. එකල මම බටහිර විද්‍යාවේ භක්තිමත් (භක්තිය හෝ ශ්‍රද්ධාව හෝ නැතිව කළහැකි දෙයක් නැත) අනුගාමිකයෙක් වීමි. ඒ භක්තිය පසුව නැතිවිය. කොළඹින් අස්කරනු ලැබීමෙන් පසුව ද මා විශ්වවිද්‍යාලයක රැකියාවක් සෙවූයේ එක් පැත්තකින් අඩුම තරමින් සිංහල බෞද්ධ චින්තනයක දැනුම නිර්මාණය කළ හැකි සිසුන් පිරිසක් බිහිකර ගැනීමට ය. එහෙත් ඒ උකුණන් ලවා ගල් ඇද්දවීමට ගත් උත්සාහයක් පමණක් විය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva